**ශීර්ෂය 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 276 බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන අයුරින් සකස් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**දේපල පිරියත හා උපකරණ**

**------------------------------**

මූල්‍ය ප්‍රකාශනවලට අදාල දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වත්කම් විෂයයන් 10 ක සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය, 2022 වර්ෂයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් අවසාන ශේෂයන් සමග සැසඳීමේදී රු.98,064,262 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිගනිමි. පසුගිය වර්ෂයේ අවස්ථා ගණනාවක දී මෙම පද්ධතිය ක්‍රියා විරහිත වී තිබූ බැවින් , මාසිකව තුලනය කිරීමට නොහැකි වූ බව සඳහන් කරමි. | සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ඉකුත් වර්ෂයේ අවසාන ශේෂයන් සමග එකඟ විය යුතුය. |
| (ආ) | එකතුව රු.2,637,248,204 ක් වූ ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර එහි නිවැරදිතාවය තහවුරු කරගෙන නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකල යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු ගම සමග පිළිසඳර වැඩසටහන මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් යටතේ රු.24,244,453 ක් වැය කර ඉදිකර තිබුණු ගොඩනැගිලි 14 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. | පිළිගනිමි. මෙම ගොඩනැගිලි 14 මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත උපදෙස් ලබා දී ඇති බව සඳහන් කරමි. | මූල්‍ය ප්‍රකාශනවලට අදාල ගැලපීම් සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් වටිනාකම රු.51,137,906 ක් වුවද, මූලධන වත්කම් අත්පත් කරගැනීමේ වැය විෂයයන් යටතේ දරන ලද වියදම රු.83,497,029 ක් වූයෙන් රු.32,359,123 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිගනිමි. SA 82 නිවැරදි කරන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටියද නිවැරදි කර නොමැති බව සඳහන් කරමි. | වෙනස හඳුනාගෙන නිවැරදි කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කලමනාකරණය

මූල්‍ය ප්‍රකාශනවලට අදාල වියදම් කලමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වියදම් මූල්‍යකරණ සාරාංශ ආකෘතියේ වැඩසටහන් 01 හි සත්‍ය වියදම රු.1,491,622,098 ක් වුවද එක් එක් වැඩසටහන් යටතේ ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණ සාරාංශ ආකෘතියේ දක්වා ඇති සත්‍ය වියදම්වල එකතුව රු.1,488,084,973 ක් වූයෙන් රු.3,537,125 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සමාන අයිතමයන් සැසඳීම් කර නිවැරදිව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |
| (ආ) | විවිධ වැය විෂයයන් යටතේ ගෙවීම් කිරීමේදී ගෙවීම්වල නිවැරදිතාවය ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 137,138 හා 200(4) ප්‍රකාරව තහවුරු කර නොගෙන ගෙවීම් කිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක් විසින් අවස්ථා 75 කදී වැඩිපුර සිදුකරන ලද රු.1,530,529 ක් වූ ගෙවීම් අදාල පරිදි වැය විෂයයන්ට අධිභාර කර තිබුණි. | එකඟ වෙමි. ඉදිරියේ දී ගිණුම් කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී නිවැරදිව, මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ වැය විෂයයන් යටතේ ගෙවීම් සිදු කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම්වල නිවැරදිතාවය තහවුරු කරගැනීමෙන් පසුව ගෙවීම් කල යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම් වලට එළඹීම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල බැරකම් හා බැදීම් වලට එළඹීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ඇමුණුම-(iii) අනුව 2023 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් කිසිවක් නොමැති වුවද පසු නිරවුල් කිරීම් පිළිබඳ නියැදි පරික්ෂාවේ දී 2024 ජනවාරි හා පෙබරවාරි මාසවල බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් රු.1,929,416 ක් 2023 වර්ෂයට අදාලව ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. | එකඟවෙමි. වර්ෂයට අදාළ සියලුම බැරකම් හදුනා ගැනීම සඳහා ඉදිරියේ දී ගිණුම් කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | වර්ෂය අවසානයට ඇති බැදීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව හෙළිදරව් කල යුතුය. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් ඉඩම් කොමසාරිස් වෙතින් ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත 2022 දෙසැම්බර් 12 දින ජල රක්ෂිත සංරක්ෂණය සඳහා ලැබී තිබුණු රු.200,000 ක යුනිසෙෆ් මූල්‍යාධාර විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 31 දක්වාම අදාල කාර්යයට යොදවා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | පිළිගනිමි. | ලැබී ඇති ප්‍රතිපාදන කාර්යක්ෂමව නියමිත කාල සීමාව තුලදී අදාල කාර්යය සඳහා උපයෝජනයට සැලැස්විය යුතුය. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරි විසින් සිදුකල යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත් එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යන බවට ගණන්දීමේ නිලධාරියාගේ සහතිකය සිදුකර ඇති බව සඳහන් කරමි. ඉදිරියේ දී ඒ පිළිබඳ ලිඛිත සමාලෝචනයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

## 2.5 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ව්‍යවස්ථාපිත විධිවිධාන | | | | |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 25(1) හා 25(5) (ආ) වගන්තිය | -- | තොරතුරු දැනගැනීම සඳහා ඉල්ලීමක් ලැබී වැඩකරන දින 14 ක් තුල හෝ යම් ප්‍රමාදයක් වේ නම් 25(5) (ආ) වගන්තිය අනුව දින 21 කට නොවැඩි කාලයක් තුල අදාල ඉල්ලීම සම්පූර්ණ කල යුතු | පිළිගනිමි. අවසන් පිළිතුර යැවීම අතපසුවීමකින් සිදුව ඇති බව කාරුණිකව සඳහන් කරමි. | තොරතුරු දැනගැනීමේ පනත අනුව කටයුතු කර අප්‍රමාදව අදාල ඉල්ලීම් ඉටුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් වෙත 2017 සිට 2023 දක්වා කාලය තුල ලැබී තිබුණු තොරතුරු දැනගැනීමේ අයදුම්පත් 15 ක් සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලීම් සම්පූර්ණ කර නොතිබුණි. | | |
| **(ආ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| • XIX -- පරිච්ඡේදයේ 6.1 වගන්තිය | පොදු සේවා නිල නිවාසයක උපරිම පදිංචි කාලය වසර 05 ක් විය යුතු වුවද ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලට අයත් පැරණි උසාවි ගොඩනැගිල්ල නිල නිවාසයක් ලෙස භාවිතා කරමින් සිටි නිලධාරියා වසර 19 ක කාලයක් අඛණ්ඩව එහි පදිංචිව සිට තිබුණි. | පැරණි උසාවි ගොඩනැගිල්ල නිල නිවසේ පදිංචිව සිටින නිලධාරි වෙත 2023.09.30 දිනට පෙර නිල නිවාසය භාරදීම සඳහා අවශ්‍ය කටයුතු කරන මෙන් ලිඛිතව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ | සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින්ම නිවාඩු හැර අනෙකුත් කාර්යයන් සඳහා SYSCGAA කාර්යාල | පිළිගනිමි. SYSCGAA කළමනාකරණ පද්ධතිය ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කිරිම සඳහා යොදා | අදාල චක්‍රලේඛයේ විධිවිධාන හා ලිපිවල උපදෙස් පරිදි කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | අංක 14/2022 හා 2022 නොවැම්බර් 10 දිනැති චක්‍රලේඛය හා අංක HA/02/23 දරන 2023 නොවැම්බර් 28 දිනැති ලිපිය | කලමනාකරණ පද්ධතිය අදාළ කර ගත යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක් විසින් එම පද්ධතිය භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. | ගනු ලැබුව ද එහි ක්‍රියාකාරිත්වයේ පවතින දෝෂ නිසා, පසුව කල ඉදිරි වැඩසටහන් ආකෘති පත්‍ර මඟින් ඉදිරිපත් කිරීම සිදු කරන ලද බව සඳහන් කරමි. | |
| (ඇ) | **2023 වර්ෂයේ ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි 2.2.2 සහ 2.2.3 ඡේදයන්** | එක් සේවා ස්ථානයක වසර 05 කට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් 10 ක් වසර 06 සිට වසර 10 දක්වා කාලයක් එකම සේවා ස්ථානයක සේවය කරමින් පැවතුණි. | පිළිගනිමි. ඉදිරියේ මේ අනුව කටයුතු කරන බව සඳහන් කරමි. | වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි සඳහන් නියමයන් අනුව කටයුතු කල යුතුය. |

## 2.6 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 42 න් 18 ක සමෘද්ධි අතිරේක දීමනාව (Top up ) ලැබූ ප්‍රතිලාභීන් 6,504 කින් 2,811 ක නියැදියක් ආශ්‍රිතව 2022 මැයි මාසය සඳහා සිදුකල ගෙවීම් පිළිබඳව පරීක්ෂාවේදී වැඩිහිටි දීමනාව, වකුගඩු දීමනාව හෝ ආබාධිත දීමනාව යටතේ අතිරේක දීමනාව ලබන නමුත් සමෘද්ධි සහනාධාරය යටතේද අතිරේක දීමනාව ගෙවීම හේතුවෙන් ද්වීගණනයට ලක්වූ ප්‍රතිලාභීන් 265 ක් වෙත අතිරේක දීමනාව ලෙස රු.736,500 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මෙම මුදලට අදාලව තැපැල් කාර්යාල මගින් ලබාදෙන මුදල් ඇණවුම් මත අධිභාර කරනු ලැබේ. | ද්වීගණනය වීම් වලක්වා ගැනීමට අදාල අංශ අතර මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කල යුතු අතර වැඩිපුර ගෙවීම් අයකරගෙන රාජ්‍ය ආදායමට බැර කල යුතුය. |

## 2.7 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 ජූලි 29 වන දින අනතුරට පත් රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනය අළුත්වැඩියා කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සමාගම විසින් 2019 දෙසැම්බර් 20 දින ලබාදී තිබුණු රු.2,500,000 ක මුදල වර්ෂයේ ආදායම් ලැබීම් ලෙස හඳුනා ගැනීම වෙනුවට එය පොදු තැන්පත් ගිණුමට බැරකර තිබුණු අතර රක්ෂණය මගින් ප්‍රතිපූරණය නොකල රු.3,849,333 ක අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර නොතිබුණි. | රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ලබාදුන් වන්දි මුදල රු.2,470,000 කි. මෙහි අළුත්වැඩියා කටයුතු සිදු වෙමින් පවතින බැවින් පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇත. | කැබ් රථය කඩිනමින් අළුත්වැඩියා කර ගැනීමට සහ රක්ෂණය මගින් ප්‍රතිපූර්ණය නොකල මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ඉඩම් අත්පත් කර ගත් ප්‍රතිලාභීන්ගේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිරවුල් කර වන්දි ලබා දීම සිදු නොකර රු.39,429,295 ක ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි මුදල් වර්ෂ 5 කට වැඩි කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොමැති බැවින්, එකී වන්දි මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇත. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිමකිරීමට කාර්යක්ෂමව කටයුතු කල යුතුය. |

## 2.8 අධිභාර කිරීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාලයේ සියළු නිල රාජකාරී කටයුතු සඳහා සංචිත රථය භාවිතා කර ඒ සඳහා ඉන්ධන ඇනවුම් මගින් ඉන්ධන ලබාගෙන තිබියදී 2022 පෙබරවාරි සිට 2023 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය තුල කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නිරත වූ ප්‍රාදේශීය ලේකම්වරු දෙදෙනෙකු | පිළිගනිමි. හිටපු ප්‍රාදේශීය ලේකම්වරයා ලබාගෙන ඇති රු. 69,135 ක ඉන්ධන දීමනාව නැවත ගෙවීම සඳහා එකඟත්වය පළකර ඇති අතර, එය ඔහු වෙත කාර්යාලයෙන් ගෙවිය | අවිධිමත් ලෙස වැඩිපුර ගෙවූ ඉන්ධන දීමනා අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| විසින් රු.812,460 ක ඉන්ධන දීමනාද ලබාගෙන තිබුණු අතර මුදල් රෙගුලාසි 119 අනුව වැඩිපුර ගෙවූ ඉන්ධන දීමනාව 2023 දෙසැම්බර් 31 දින වන විට ද අයකරගෙන නොතිබුණි. | යුතු හිඟ මුදල් ගෙවීමේ දී අයකර ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි.<br><br>කන්දකැටිය - ප්‍රාදේශීය ලේකම්වරයා ලබාගෙන ඇති රු.743,325 ක ඉන්ධන දීමනාව එම මහතාට නිල වාහනය ලැබීමෙන් පසු ඒ සඳහා ලබාදෙන ඉන්ධන දීමනාවෙන් ගෙවීමට එකඟතාවය පළ කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.<br><br>ඉහත සඳහන් මුදල් රෙගුලාසි 119(2)(ආ) අනුව වාරික 60 කින් අය කිරීම සුදුසු බව අනුමැතිය සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී පහත සහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු අතර ඒ සඳහා භාවිතා කල යුතු ආකෘති පත්‍ර හා දත්ත ඇතුලත් කිරීමේ මාර්ගෝපදේශ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ලබාගත යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය | පිළිගනිමි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම, මෙහෙවර හා අරමුණු 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති බව සඳහන් කරමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතුය. |

සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම පරීක්ෂා කිරීමේදී උක්ත මාර්ගෝපදේශයන්ට අනුකූල නොවන පරිදි කටයුතු කර තිබුණු අවස්ථා 06 ක් නිරීක්ෂණය විය.

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ රු.10,227,818 ක් වැයකර ග්‍රාම නිලධාරි කොට්ඨාශ 02 ක් ආවරණය වන පරිදි ප්‍රතිලාභී පවුල් 183 ක් තෝරාගෙන, හරිතාගාර තුල මල් හා එළවළු වගාකිරීම, කුකුල් පාලනය, එළුවන් පාලනය හා මී මැසි පාලනය යන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතිය තුලින් ප්‍රතිලාභියෙකුගේ මාසික සාමාන්‍ය ආදායම රු.30,000 - 40,000 ත් අතර මට්ටමකට ලගා කරවීම ව්‍යාපෘතියේ ප්‍රධානතම ඉලක්කය වුවද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු ප්‍රතිලාභියෙකුගේ මාසික සාමාන්‍ය ආදායම රු.500 ත් රු.3,500 අතර මට්ටමක පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ආදායම් ඉලක්කයන් ලගාකරගෙන නොමැති බව නිරීක්ෂණය විය. | පිළිගනිමි. ආර්ථික අවපාතය සහ කොවිඩ් වසංගත තත්ත්වයන් හා කෘෂි යෙදවුම් වල මිල ඉහළ යාම, පොහොර තහංචි, සංචරණ සීමා පැනවීම යන කරුණු හේතුවෙන් අස්වැන්න අඩු වීමත් ආදායම් මාර්ග ඇහිරීම නිසා ලැබෙන ආදායම ජීවන වියදමට යොමු කිරීමත් හේතුවෙන් නිෂ්පාදන හා වගාවන් සඳහා යෙදවීමට මුදල් ප්‍රමාණවත් නොවීමෙන් නිෂ්පාදන ආදායම අඩු වීමත්, නිෂ්පාදන ධාරිතාව පහළ යාමත්, ඒක පුද්ගල ආදායම අඩු වීමත් සිදු වූ බව සඳහන් කරමි. | අඛණ්ඩ පසුවිපරම් කටයුතු මගින් ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට හා අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියාකල යුතුය. |
| (ආ) | රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 92 ක් වෙත රු.4,048,000 ක් වැයකර කිකිළි පැටවුන් 9,200 ක්ද රු.5,391,472 ක් වැයකර උපකරණ ඇතුළු කුඩු ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යද ලබාදී තිබුණු අතර ලබා දෙන ලද කිකිළි පැටවුන් 9,200 ක් අතරින් විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 08 දින වන විට 7,371 ක සංඛ්‍යාවක් මියගොස් හෝ විකුණා තිබුණි. එම සංඛ්‍යාව ලබාදුන් | කොරෝනා වසංගතයත් ආර්ථික දුෂ්කරතාවයත් හේතුකොටගෙන ප්‍රතිලාභීන්ට සත්ත්ව ආහාර සපයා ගැනීමට අපහසු වීමෙන් කිකිළි පැටවුන් සැළකිය යුතු ප්‍රමාණයක් මියගොස් ඇති බව පිළිගනිමි. | අඛණ්ඩ පසුවිපරම් කටයුතු මගින් ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කර අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කිකිළි පැටවුන් ගණනින් සියයට 80 ක් පමණ වූ අතර ඒ සඳහා රජය වැයකල රු.3,243,240 ක මුදලින් වැඩි ප්‍රතිශතයක් නිශ්ඵල වියදමක් බවට පත්වී තිබුණි. | | |
| (ඇ) | (i) | ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු.5,944,977 ක් වැයකර 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද බතික් හා අත්‍යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිමි ඇඳුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 02 කට වැඩි කාලයක් ගතවී තිබුණද, මේ දක්වාද ව්‍යාපෘතිය ආරම්භක අවධියේ පසුවන බව නිරීක්ෂණය විය. තවද ව්‍යාපෘති වාර්තාව අනුව සංචාරකයින් ඉලක්ක කරගත් නිෂ්පාදන බිහිකිරීම, අපනයන වෙළඳපල ඉලක්ක කරගත් නිෂ්පාදන ඇතිකිරීම ඇතුළු අනෙකුත් අරමුණු සඵලදායී ලෙස ඉටුකරගෙන නොතිබුණු අතර එම අරමුණු ඉටුකරගැනීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක්ද 2023 වර්ෂය සඳහා සකස් කර නොතිබුණි. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ ගැටළු සඳහා ඵලදායී විසඳුමක් ලබාදීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අපොහොසත් වන්නේ නම් ප්‍රතිලාභීන් ව්‍යාපෘතියෙන් ඉවත් වීමේ අවධානමක් පවතින බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය. | නිෂ්පාදකයින්ට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා දීමට, වෙළඳපොල හඳුනාගැනීම යටතේ online අලෙවිකරණයට පිවිසීමට පුහුණු වැඩසටහන් පැවැත්වීම, ලක්සල ආයතනයට නිෂ්පාදන සැපයීමට ඇනවුම් ලබාගැනීම, ඇල්ල ප්‍රදේශයේ අලෙවි සතිපොලක් පැවැත්වීම, නයිටා ආයතනය සමග එක්ව පුහුණු අවස්ථා ලබාදීම වැනි ක්‍රියාමාර්ග තුලින් ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා කටයුතු කර ඇත. | අඛණ්ඩ පසුවිපරම් කටයුතු මගින් ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාක්මක කර අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |
| | (ii) | ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ බතික් හා අත්‍යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිමි ඇඳුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය සඵලදායී ලෙස සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.1,283,024 ක් වැයකර මිලදී ගෙන තිබුණු රෙදි පින්තාරු කිරීමේ උපකරණවලින් උපකරණ 35 ක් විගණිත දිනය වූ 2023 සැප්තැම්බර් 06 වන විටද භාවිතයට නොගෙන ඌණ උපයෝජිතව මධුරගම රෙදි පින්තාරු කිරීමේ ගොඩනැගිල්ලේ තබා තිබුණි. | පිළිගනිමි. ඉදිරියේ දී ලැබෙන ප්‍රතිපාදන අනුව වර්ණ කිහිපයකින් ටී ෂර්ට් මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පවත්වා ප්‍රතිලාභීන් දැනුවත් කිරීමට සැලසුම් කර ඇත. | |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පස්සර හා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ පිළිවෙලින් රු.7,139,063 ක් හා රු.7,255,335 ක් වැයකර 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු මඩුගස්තලාව හා ගල්වෙලගම කිතුල් ගම්මානයන් බිහිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 02 කට කාලයක් අවසන් වුවද අපේක්ෂිත අරමුණු සඵලදායී ලෙස ලඟාකර ගෙන නොතිබුණි. ඒ අනුව රජය විසින් වැය කල මුදලට සාපේක්ෂව ප්‍රතිදානයක් (outcome) ලබා ගැනීමට අපොහොසත් වී ඇති බවත්, සාම්ප්‍රදායිකව කිතුල් කර්මාන්තයේ නියැලෙන පවුල් 212 ක් තෝරාගෙන උපකරණ ලබාදීමත්, පුහුණු අවස්ථාවන් කිහිපයක් ලබාදීමත් හැර වාණිජ මට්ටමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට හා ජාතික නිෂ්පාදනය වැඩිකර ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා දායකවීමට ව්‍යාපෘතිය අපොහොසත් වී ඇති බවත් නිරීක්ෂණය විය. | පිළිගනිමි. කොවිඩ් කාලවකවානුව තුල වසම් තුළට ප්‍රවේශ වීමට නොහැකි විය. ව්‍යාපෘති අරමුණ ඉටු කර ගැනිම සඳහා වඩාත් ශක්තිමත් මෙහෙයුම් ක්‍රියාවලියක් සකස් කර ක්‍රියාත්මක කිරිමේ වගකීම, වසමට අනුයුක්ත සංවර්ධන නිලධාරියාට පවරන ලදී. ඵල දැරිය හැකි කිතුල් ගස් සුලබව පැවතියද එක් එක් ශාකයකින් ලබා ගන්නා තෙලිදිය ප්‍රමාණයන් වෙනස් වේ. වනගහනය සුලභ ප්‍රදේශයක් බැවින් ශක්ති ප්‍රභවය ලෙස ගෑස් ප්‍රතික්ෂේප කර දර භාවිතා කිරීමට ප්‍රතිලාභීන් පෙළඹී ඇත. ආරක්ෂිතව කර්මාන්තය කරගෙන යාම සඳහා වැහි කබා, ආරක්ෂිත බඳ පටි, හිස් ආවරණ ආදියද ලබා දෙන ලදී. | ඉදිරියේදී ව්‍යාපෘතිය සාර්ථකව පවත්වා ගනිමින් අපේක්ෂිත ඉලක්කයන් අත්කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නායයෑමේ අධි අවදානමට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනකට අයත් පවුල් 236 ක් නැවත පදිංචි කිරීම සඳහා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාලව රු.46,200,000 ක් වැයකර තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 03 සිට 10 දක්වා කාලයක් ගත වී තිබුණද මෙම අවදානමට ලක්වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා සාධනීය ක්‍රියාමාර්ග ගෙන | හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව වතු සමාගම මගින් යෝජිත ඉඩම නිදහස් කිරීම ප්‍රමාද වීමෙන් නැවත පදිංචි කිරීම ප්‍රමාද විය. එම ප්‍රමාදය වතු සමාගම භාරගත යුතු අතර, එහි සමස්ථ වගකීම මෙම කාර්යාලයට භාරගත | නායයාමේ අවදානමට ලක්වූ ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනමින් සිදු කල යුතුය. |

| | | |
|---|---|---|
| නොතිබුණු බැවින් අවදානමට ලක්වූ පවුල් ජීවිත අවදානම දරා ගනිමින් මුල් ස්ථානවලම පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය. | නොහැක.<br><br>හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ප්‍රතිලාභීන්ගේ කැපවීම, උත්සහය සහ කාර්යක්ෂම බව නොමැති කමින් ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට නොහැකි වී ඇත. තවදුරටත් මේ සම්බන්ධයෙන් දැඩි අවධානය යොමුකර ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.<br><br>හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් නැවත පදිංචි කිරීමේ වැඩ සටහන යටතේ උඩකොහොවිල අක්කර 100 යන ස්ථානයේ නිවාස ව්‍යාපෘතියේ වැඩ මේ වන විට සිදු කරමින් පවතින අතර, මෙම වර්ෂයේ ජූලි මස 01 වැනි දින වන විට මෙම පවුල් 37 පදිංචි කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව සඳහන් කරමි. | |

**3.4 වත්කම් කලමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කන්දකැටිය හා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සුදු ගම්මිරිස් නිෂ්පාදන ව්‍යාපෘති සඳහා 2022 මැයි 20 හා 21 වන දිනවල ස්ථාපිත කරන ලද පිරිවැය රු.4,555,000 ක් වූ ගම්මිරිස් වියලන යන්ත්‍ර 02 ක් 2024 මාර්තු 31 දින වන විටත් ඌණ උපයෝජිතව පැවතුණි. | ගම්මිරිස් අස්වැන්න අඩුවීමෙන් යන්ත්‍රය උපයෝගී කරගෙන අපේක්ෂිත පරිදි ගම්මිරිස් වියලා ගැනීමට නොහැකි විය. අපනයන ව්‍යාප්ති නිලධාරි විසින් 2024 දී සකස් කල විකල්ප භෝග | විශාල වටිනාකමක් සහිත මෙම යන්ත්‍රවල උපරිම ධාරිතාවයම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු සැලැස්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වියලීමේ සැලැස්ම අනුව ව්‍යාපෘති යෝජනා සකස් කර එම කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර ඇත. | |
| (ආ) | බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම ශක්ති ජනතා සමිති 160 ක් සතු රු.44,898,005 ක අරමුදල් නිසි පරිදි කාර්යක්ෂමව ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වය ඉහල නැංවීම සඳහා යොදවා නොගෙන නිශ්කාර්යව බැංකු ගිණුම්වල පවතින බව නිරීක්ෂණය විය. | අක්‍රීය සමිති සතු මුදල්, සක්‍රීය සමිති වෙත මාරු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත. | ග්‍රාම ශක්ති ජනතා සමිති සතු අරමුදල්, ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම සඳහා කාර්යක්ෂමව යෙදවිය යුතුය. |

## 3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබාගෙන තිබුණු විශ්‍රාමිකයකු 2015 ඔක්තෝබර් 31 දින මියගොස් තිබුණද විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය යාවත්කාලීන වී නොතිබීම හේතුවෙන් මියයාමෙන් පසුවද 2019 ජූනි 30 දින දක්වා එකතුව රු.1,412,812 ක විශ්‍රාම වැටුප් ඔහුගේ බැංකු ගිණුමට බැරවී තිබීමෙන් එම මුදල ඔහුගේ උරුමකරුවන් විසින් ලබාගෙන තිබුණු අතර ඉන් රු.650,484 ක මුදලක් 2023 දෙසැම්බර් 31 දින වන විටද නැවත අයකර ගෙන නොතිබුණි. | පිළිගනිමි. වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක: 21-1100013 දරන මියගිය විශ්‍රාමිකයාගේ උරුමකරු විසින් ලදුපත් අංක: 0235338 හා 2024.01.29 දින රු. 100,000 ක් ගෙවා ඇත. | විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම මගින් වැඩිපුර ගෙවීම් වලක්වා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමිකාවක් වෙත වැඩිපුර ගෙවන ලද රු.386,075 ක විශ්‍රාම වැටුප් ගෙවීම | පිළිගනිමි. අදාල විශ්‍රාමිකාවට වැඩිපුර ගෙවන ලද රු.386,075 ක මුදල, | විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම මගින් වැඩිපුර ගෙවීම් වලක්වා ගැනීමට කටයුතු කල යුතු අතර |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව උරුමකරුවන්ගෙන් අයකරගත යුතු වුවද එම මුදල ගෙවීමට නොහැකි බව උරුමකරුවන් විසින් 2024 මාර්තු 05 දින දැනුම් දී ඇති නමුත් මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් 2024 මාර්තු 31 දින වන විටත් ගෙන නොතිබුණි. | උරුමකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන ලෙස බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී ඇති බව සඳහන් කරමි. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය. |
| (ඈ) | ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අනතුරට ලක් වී වර්ෂ 08 කට පසු ඊට අදාල අලාභ හානිය රු.500,000 ක් ලෙස 2019 මැයි 15 දින තක්සේරු කර තිබුණු අතර, මු.රෙ 104(4) පරීක්ෂණ වාර්තාව අනුව අනතුර සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් එම අලාභය අයකර ගන්නා ලෙස නිර්දේශ කර තිබුණද 2024 මාර්තු 31 දින වන වන විට ද අයකර ගෙන නොතිබුණි. 2021 දෙසැම්බර් 26 දින මේ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ඉල්ලා තිබීම හැර වෙනත් සාධනීය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මු.රෙ. 104 (4) අවසන් වාර්තාව 2022.06.23 දින ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. එහි අලාභ මුදල රු.500,000 කි. එහි රියදුරුගෙන් අලාභ මුදල අයකර ගැනීමට නීතිපති උපදෙස් සඳහා යොමුකර ඇත. | වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.පරීක්ෂණ විධිමත්ව හා අප්‍රමාදව පැවැත්විය යුතු අතර හඳුනාගත් අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |

## 3.6 කලමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව පළාත් සභාවකට නිලධාරීන් මාරු වී යන්නේ නම් එම පළාත් සභාවෙන් අදාල ණය මුදල් එකවර අයකර ගැනීමට කටයුතු කල යුතු අතර එසේ අයකර ගත නොහැකි නම් මාසික වාරික | අදාළ ලැයිස්තුවෙහි සඳහන් කලමනාකරණ සේවා නිලධාරිනියගේ ණය ශේෂය වාරික වශයෙන් අයවන අතර, දැනට ඇයගෙන් අයවීමට ඇති ණය ශේෂය රු.203,800 කි. අනෙකුත් නිලධාරීන්ගේ | අදාල අයවැය චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කර අයවිය යුතු ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වශයෙන් හෝ අයකර ගැනීමට කටයුතු කල යුතු වුවද බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කර පළාත් සභා ආයතන වලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 08 කගෙන් අයවිය යුතු රු.882,843 ක ණය ශේෂයක් 2023 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි. එම ණය ශේෂයන් තුල වසර 10 ටත් වැඩි කාලයක සිට පැවත එන නිලධාරීන් 03 කගෙන් අයවිය යුතු රු.223,327 ක ණය ශේෂයක් හා වසර 20 ට වැඩි කාලයක සිට පැවත එන නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.297,532 ක ණය ශේෂයක් ද ඇතුළත්ව තිබුණි. | ණය ශේෂ නිරවුල් කරන ලෙස ඌව පළාත් සභාව වෙත ලිඛිතව දන්වා ඇතත් මේ වනතෙක් නිරවුල් කර නොමැත. | |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් මූලික වැටුප, ජීවන වියදම් දීමනා සහ පාරිතෝෂික වැඩිපුර ගෙවීම හේතුවෙන් විශ්‍රාමිකයන් 64 ක් වෙත රු.16,597,873 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර 2023 දෙසැම්බර් 31 වන විට එයින් ආපසු අයකර ගත යුතු මුදල රු.9,081,544 ක් විය. තවද, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 3/2022 හා 2022 ජූනි 10 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 07 වගන්තිය අනුව විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කටයුතු කල යුතු අතර ඒ සඳහා රජයේ මුදල් රෙගුලාසි අංක 101 සිට 113 දක්වා වූ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ 2 කාණ්ඩයේ විධිවිධානද ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අනුගමනය කල යුතු බව දක්වා ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. මේ මගින් සඳහන් කර තිබූ විශ්‍රාමිකයන්හට වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගැනීමට අදාළ කාර්යයන් සිදුකරමින් පවතියි. | විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම සම්බන්ධයෙන් අදාල විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ සඳහන් ආකාරයට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 02 (i) ඡේදය හා 2023 මැයි 12 දිනැති අංක 2/2021 (viii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සියළුම රජයේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම, ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතයෙන් සනාථ කල යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක මාණ්ඩලික නිලධාරීන් 17 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් 04 විසින් මහජන දිනයේදී පමණක් ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම තහවුරු කරන බවත් කාර්යාලයේ රැඳී සිටින අනෙකුත් දිනවලදී ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම තහවුරු නොකරන බවත් නියැදි පරීක්ෂාවන් වලදී නිරීක්ෂණය විය. තවද නියැදි පරීක්ෂාවට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක නිලධාරීන් 07 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකු දින 118 ක් සඳහා එලෙස පැමිණීම/පිටවීම සනාථ නොකල රජයේ නිවාඩු දිනවල රාජකාරියට වාර්තා කල බව සඳහන් කර ඒ සඳහා නිවාඩු දින වැටුප් ලෙස රු. 504,030 ක් ලබා ගෙන තිබුණි. | පිළිගනිමි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගත්බව කාරුණිකව සඳහන් කරමි.<br>• ඉදිරියේ දී පැමිණීම හා පිටවීම යන දෙකම ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගන්නා බව සඳහන් කරමි.<br>• නිලධාරින් නිවාඩු දින වැටුප් ලබා ගැනීමට වවුචර ඉදිරිපත් කිරීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රයේ දෛනික සටහන් නිවැරදිව පරීක්ෂාකර බලා "පැමිණීමේ ලේඛනය අනුව පැමිණීම හා පිටවීම නිවැරදියි" යන මුද්‍රාව තැබීම අනිවාර්ය බවට අදාළ නිවාඩු විෂයභාර නිලධාරියාට උපදෙස් දුනිමි. | අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ඈ) | රජයේ ඉඩම්වල අයිතිය සුරක්ෂිත කිරීම සඳහා අනවසර අල්ලා ගැනීම් කටයුතු වලක්වා ගැනීම පිණිස සියළුම ග්‍රාම නිලධාරීන් විසින් තම වසම තුල පවතින අනවසරයෙන් අල්ලා ගැනීම් සම්බන්ධයෙන් ආ.ඒ.ආ.60 ආකෘති පත්‍ර මගින් සෑම දෙසතියකට වරක්ම ප්‍රාදේශීය ලේකම්වරයා දැනුවත් කලයුතු වුවත් මහියංගන ප්‍රාදේශීය | පිළිගනිමි. මහියංගණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙසති වාර්තා ලබා නොදුන් ග්‍රාම නිලධාරීන් සම්බන්ධයෙන් ඔවුන්ගෙන් නිදහසට කරුණු විමසා නිසි ක්‍රියාමාර්ග ගනු ලබන බව සඳහන් කරමි. | විධිමත් පරිදි දෙසති වාර්තා ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරීන් 20 ක් විසින් දෙසති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | | |
| **(ඉ)** | 2006 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය වෙත යොමු කරන ලද මැනුම් ඉල්ලීම් 1147 ක් ඉටු කරවා ගෙන නොතිබුණි. | පිළිගනිමි. මැනුම් නියෝග ඉටුකරවා ගැනීම සඳහා මිනින්දෝරු අධිකාරිය වෙත සිහි කැඳවීම් ලිපි යොමුකර ඇති බව සඳහන් කරමි. | මැනුම් නියෝග කඩිනමින් ඉටු කරවා ගැනීම සඳහා අවශ්‍ය පසුවිපරම් කටයුතු කල යුතුය. |
| **(ඊ)** | මීගහකිවුල හා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ අනවසර අල්ලා ගැනීම් සම්බන්ධයෙන් සන්තකය ආපසු ලබාගැනීම සඳහා ලැබී තිබූ නෙරපීම් නියෝග 21 ක් ලැබී මාස 9 ත් වසර 5 ත් අතර කාලයක් ගතවී ඇතත් එම නියෝග ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රජයේ දේපල අයථා පරිහරණයකට ඉඩකඩ සැලසීමක් සිදුවී ඇති බව නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය විය. | පිළිගනිමි. බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනවසර අල්ලා ගැනීම් සම්බන්ධ පුද්ගලයින් මුදල් ගෙවීමට ඉදිරිපත් නොවුව හොත් සන්තකය ආපසු ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව සඳහන් කරමි. | සුදුසු ආකාරයට ප්‍රතිපාදන සලසා ගෙන නෙරපීමේ නියෝග ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |
| **(උ)** | බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 කට අයත් සමෘද්ධි බැංකු 47 ක් විසින් ප්‍රතිලාභීන් 2,636 කට ලබාදෙන ලද ණය මුදලින් රු.194,512,752 ක බොල්ණය 2023 දෙසැම්බර් 31 වන විටද අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකරමින් පවතී. | අදාල ණය ගිවිසුම් අනුව කටයුතු කර හිඟ මුදල් අයකර ගත යුතුය. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුව තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කට ලද දැව හෙලීම් බලපත්‍ර ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍ර 155 ක් මාස 1 ත් 22 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව ලියාපදිංචි කර නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව මහජනතාව සඳහා කාර්යක්ෂම හා කඩිනම් සේවාවක් ලබා දීමේ අවශ්‍යතාවය පුරවැසි ප්‍රඥාප්තිය තුල තහවුරු කර තිබියදී ඊට අනුකූලව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | පිළිගනිමි. දැව කපා හෙලීමේ අයදුම්පත්‍රය කාර්යාලයට ලද පසු, ඉඩමේ අයිතිය නිරවුල් කිරීම, අයිතිකරුගේ කැමැත්ත සනාථ කරගැනීම, දැව හෙලීම් අවශ්‍යතාවය සනාථ කර ගැනීම, වෙනත් ආයතන අනුමැති ලබා ගැනීම, ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම යනාදී ක්‍රියාවලි පිළිවෙලින් සිදු කිරීම තුලින් නීති විරෝධී දැව හෙලීම් වලක්වා ලීමට කටයුතු කිරීම හේතුවෙන් මෙම ප්‍රමාදයන් සිදුව ඇත. | මහජනතාව සඳහා කාර්යක්ෂම හා කඩිනම් සේවාවක් ලබා දීම සඳහා කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුව තුලදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 කට අදාලව තනි පුද්ගල ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා ලද අයදුම්පත් 73 ක් මාස 1 ත් 11 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව ලියාපදිංචි කර නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය. | පිළිගනිමි. ව්‍යාපාර ආරම්භ කර නොතිබීම, අයදුම්පත්වල අඩුපාඩු පැවතීම, නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය, මාණ්ඩලික නිලධාරි හිඟය ආදී ගැටළු හේතුවෙන් ලියාපදිංචි සහතික නිකුත් කිරීම.<br><br>කල්ගත වු බවත් ඉදිරියේ දී කාල ප්‍රමාදයකින් තොරව තනි පුද්ගල ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමට කටයුතු කරන බවත් සඳහන් කරමි. | මහජනතාව සඳහා කාර්යක්ෂම හා කඩිනම් සේවාවක් ලබා දීම සඳහා කටයුතු කල යුතුය. |

**(ඇ)** ජනාධිපති ලේකම්වරයාගේ 2020 සැප්තැම්බර් 15 දිනැති අංක PC/GPA/Circular/29/2020 දරන චක්‍රලේඛය අනුව සියළුම රජයේ ආයතනවල නිලධාරීන් මහජන දිනය වන සඳුදා දිනය තුල තම කාර්යාලයේ රැඳී සිටිය යුතු අතර අත්‍යාවශ්‍ය කටයුත්තකට හැර එදිනට නිවාඩු ගැනීමෙන් හා කාර්යාලයෙන් පිටත රාජකාරි යොදා ගැනීමෙන් වැලකිය යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක මාණ්ඩලික නිලධාරීන්ගෙන් හා මාණ්ඩලික නොවන නිලධාරීන්ගෙන් සැලකිය යුතු පිරිසක් සඳුදා දිනය තුල කාර්යාලයේ සේවයට වාර්තා කර නොතිබුණි.

පිළිගනිමි. මෙහි සඳහන් කර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රාදේශීය ලේකම්වරුන් මේ පිළිබඳව දැනුවත් කර ඇති අතර, ඉදිරියේ දී අත්‍යාවශ්‍ය කටයුත්තකට හැර සඳුදා දින නිවාඩු ලබා නොදෙන බවත්, නිවාඩු අවම කිරීමට කටයුතු කරන බවත් කාරුණිකව සඳහන් කරමි.

අදාල චක්‍රලේඛයේ විධිවිධාන අනුව මහජන දිනය තුලදී මහජන අවශ්‍යතාවන් සපුරා ගැනීමට බාධාවක් නොවන ලෙස නිලධාරීන් කාර්යාලය තුල රඳවා ගැනීමට කටයුතු කල යුතුය.